සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

**10 | S | I, II**

| ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 - 10 | |
| 11 - 25 | |
| 26 - 35 | |
| 36 - 40 | |
| එකතුව | |

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கை பரீட்சைத் திணைக்களம் /
Department of Examinations, Sri Lanka

# 2568 – පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය – 2024 (2025)

## (10) භූගෝල විද්‍යාව - I, II

පැය තුනයි

### භූගෝල විද්‍යාව - I පත්‍රය

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : ..............................

※ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය. (ලකුණු 01 × 40 = 40 යි)
※ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම** ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

..............................
නිරීක්ෂකගේ අත්සන

- අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා, තිත් ඉර මත ලියන්න.

1. ශ්‍රී ලංකාවේ දකුණු කෙළවර ලෙස සැලකෙන දෙවුන්දර තුඩුව පිහිටා ඇත්තේ .................................... දිස්ත්‍රික්කයේ ය.
(ගාල්ල / මාතර / හම්බන්තොට)

2. මුහුදු මට්ටමේ සිට උන්නතාංශය වැඩිවන විට වායු පීඩනය ....................................
(අඩු වේ. / වැඩි වේ. / එක සේ පවතී.)

3. අනිලමානය යොදාගනු ලබන්නේ .................................... මැනීම සඳහා ය.
(සුළං හමන දිශාව / සුළඟේ වේගය / වාතයේ ආර්ද්‍රතාව)

4. අක්ෂාංශ $66\frac{1}{2}^{\circ}$ සිට ධ්‍රැවය දක්වා වන ප්‍රදේශය .................................... කලාපය ලෙස හැඳින්වේ.
(නිවර්තන / සෞම්‍ය / ශීත)

5. අත්ලන්තික් සාගර ප්‍රදේශයේ හටගන්නා වාසුළි ........................ ලෙස හැඳින්වේ.
(ටයිෆූන් / විලිවිලීස් / හරිකේන්)

6. ක්ෂය වන ස්වභාවික සම්පතකට උදාහරණයක් ලෙස .................................... දැක්විය හැකි ය.
(ඛනිජ තෙල් / සුළං / හිරුඑළිය)

7. ඩොලමයිට් ඛනිජය .................................... නිෂ්පාදනය සඳහා යොදාගැනේ.
(පොහොර / වීදුරු / ඖෂධ)

8. පස තුළට කිඳා බැස පතුල් පාෂාණවල ආධාරයෙන් පොළොව තුළ තැන්පත් වන ජලය, ........................ ජලය ලෙස හැඳින්වේ.
(භූතල / පාංශු / භූගත)

9. රතු කහ ලැටසෝල් පස ශ්‍රී ලංකාවේ .................................... වෙරළබඩ ආශ්‍රිතව ව්‍යාප්තව පවතී.
(ඊසාන / වයඹ / ගිණිකොන)

10. ශ්‍රී ලංකාවේ වැඩිම මත්ස්‍ය නිෂ්පාදනය සිදුවන්නේ ............................ ධීවර කර්මාන්තය මගිනි.
(වෙරළාසන්න / ගැඹුරු මුහුදු / මිරිදිය)



Department of Examinations Sri Lanka

- අංක **11** සිට **15** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති ප්‍රකාශය කියවා බලා, එය නිවැරදි නම් 'නි' යන්න වටා ද, වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.

11. වර්තමාන ලෝක ජනගහනය බිලියන නවය ඉක්මවා ඇත. ( නි / වැ )

12. මව් පාෂාණය හා දේශගුණය පාංශු නිර්මාණයට බලපාන ප්‍රධාන සාධක දෙකකි. ( නි / වැ )

13. මෝටර් රථ නිෂ්පාදනය කරන රටවල් අතුරින් ලොව ප්‍රමුඛස්ථානය ගන්නා රට ජපානයයි. ( නි / වැ )

14. මෝටර් රථයක සවිකර ඇති GPS ග්‍රාහකය මගින් තමන් යා යුතු කෙටිම මාර්ගය පහසුවෙන් සොයාගත හැකි ය. ( නි / වැ )

15. ජල සම්පත රැකගැනීම සඳහා ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කළ යුතු ය. ( නි / වැ )

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රකාශයේ හිස්තැනට සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.

16. ශ්‍රී ලංකාවත් ඉන්දියාවත් අතර පිහිටි පටු නොගැඹුරු මුහුදු තීරය ................................... ලෙස හැඳින්වේ.

17. කහටගහ, කොලොන්ගහ, බෝගල යන පතල් කැණීම්වලින් ලබා ගන්නා ඛනිජ වර්ගය .......................... ය.

18. තම්බපවනී සුළං බලාගාරය ................................ දූපතේ පිහිටා ඇත.

19. ශ්‍රී ලංකාවේ ................................ පර්යේෂණ ආයතනය තලවකැලේ නගරයේ පිහිටුවා ඇත.

20. කිරි නිෂ්පාදනය පිළිබඳ ලොව ප්‍රමුඛස්ථානය ගන්නා රට ................................ යි.

- අංක **21** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, එම වරණයෙහි අංකය ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.

21. ශ්‍රී ලංකාවට අකුණු උපද්‍රව වැඩි වශයෙන් ඇති වන්නේ,
    (1) සංවහන වැසි කාලයේදී ය. (2) නිරිතදිග මෝසම් කාලයේදී ය.
    (3) ඊසානදිග මෝසම් කාලයේදී ය. (4) වාසුළි වැසි කාලයේදී ය. (.........)

22. ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝගයක් වන පැඟිරි වගා කෙරෙන දිස්ත්‍රික්ක දෙක ඇතුළත් වරණය තෝරන්න.
    (1) මහනුවර, නුවරඑළිය (2) මාතර, හම්බන්තොට
    (3) මාතර, ගාල්ල (4) මහනුවර, කෑගල්ල (.........)

23. මාරවිල, නාත්තන්ඩිය හා හලාවත යන ප්‍රදේශවල බහුලව ව්‍යාප්තව ඇති ඛනිජ වර්ගය කුමක් ද?
    (1) පිඟන් මැටි (2) වීදුරු වැලි (3) මැණික් (4) හුණුගල් (.........)

24. 2000 mm වැඩි වර්ෂාපතනය, කබොක් මිශ්‍ර රතු පස, මද බෑවුම් සහිත භූමිය යන භෞතික සාධක මින් කුමන වගාවක් සඳහා සුදුසු වේ ද?
    (1) පොල් (2) රබර් (3) වී (4) කජු (.........)

25. ශ්‍රී ලංකාවේ සංචාරක කලාප අතුරින් 'පුරාණ නගර' ලෙස හැඳින්වෙන කලාපයට අයත් නගර පමණක් ඇතුළත් වරණය තෝරන්න.
    (1) ගාල්ල, මාතර, කතරගම (2) අනුරාධපුරය, ත්‍රිකුණාමලය, කුරුණෑගල
    (3) සීගිරිය, මහනුවර, දඹුල්ල (4) අනුරාධපුරය, වවුනියාව, මන්නාරම (.........)

[ 3 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

26. ශ්‍රී ලංකාවේ පිහිටි විශාලතම ජාතික වනෝද්‍යානය කුමක් ද?
(1) විල්පත්තුව (2) සෝමාවතිය (3) උඩවලව (4) මාදුරු ඔය (.........)

27. වගා බිම් කැබලි කර විකිණීම නිසා වර්තමානයේදී දේශීය පරිභෝජන අවශ්‍යතා සපුරාලීම පිළිබඳ වඩාත් ගැටලු සහගත තත්ත්වයක් ඇති වී තිබෙන්නේ මින් කුමන වගාවක ද?
(1) රබර් (2) පොල් (3) කුරුඳු (4) කෙසෙල් (.........)

28. ශ්‍රී ලංකාවේ තේ අපනයනය කරනු ලබන මැදපෙරදිග රටවල් දෙකක් දැක්වෙන නිවැරදි වරණය තෝරන්න.
(1) ඉරාකය සහ ඇමරිකා එක්සත් ජනපදය (2) රුසියාව සහ ජෝර්දානය
(3) සිරියාව සහ යුක්රේනය (4) ඉරානය සහ ඉරාකය (.........)

29. විදේශීය ආයෝජකයන් විසින් බලශක්තිය හා ලාභදායී ශ්‍රමය පදනම් කරගෙන සංවර්ධනය වෙමින් පවතින රටවල ස්ථානගත කර ඇති කර්මාන්තය කුමක් ද?
(1) ඇඟළුම් (2) ගුවන්යානා (3) මෝටර් රථ (4) විද්‍යුත් (.........)

30. සුමාත්‍රා, ජාවා සහ බෝර්නියෝ යන අග්නිදිග ආසියානු දූපත් අයත් වන භූ තැටිය කුමක් ද?
(1) ඉන්දු - ඕස්ට්‍රේලියානු (2) අප්‍රිකානු
(3) යුරේෂියානු (4) පැසිෆික් (.........)

31. ලෝකයේ ජෛව විවිධත්වය අධිකතම වනාන්තර වර්ගය කුමක් ද?
(1) කේතුධර (2) නිවර්තන වර්ෂා (3) සෞම්‍ය කලාපීය (4) සැවානා (.........)

32. විද්‍යුත් කර්මාන්ත හා සම්බන්ධ පොදු ලක්ෂණයක් නොවන්නේ මින් කුමක් ද?
(1) විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කර තිබීම.
(2) අධිතාක්ෂණය භාවිත කර තිබීම.
(3) විශේෂඥ ශ්‍රමය බහුලව භාවිත කිරීම.
(4) විශාල සේවක සංඛ්‍යාවක් නිරත වීම. (.........)

33. 2025 වසරේ ජනවාරි මාසයේ මහා ලැව්ගින්නක් ඇති වී ප්‍රබල ආපදා තත්ත්වයක් ඇති වූයේ කුමන රටක ද?
(1) ඇමරිකා එක්සත් ජනපදය (2) ඕස්ට්‍රේලියාව
(3) ආර්ජන්ටිනාව (4) චීනය (.........)

34. හෞම පද්ධතියේ සමතුලිතතාව හා සංරක්ෂණය සඳහා මනා කළමනාකාරිත්වයකින් යුතුව පවත්වාගෙන යාමට අවශ්‍ය හරවත් යහපුරුදු හැඳින්වෙනුයේ,
(1) තිරසර සංවර්ධන අභිමතාර්ථ ලෙසිනි. (2) පරිසර සංරක්ෂණ පනත් ලෙසිනි.
(3) පරිසර ආචාරධර්ම ලෙසිනි. (4) පරිසර සම්මුති ලෙසිනි. (.........)

35. බුදුසමයේ භික්ෂූන් වහන්සේලාට අනුදැන වදාළ පහත සඳහන් පිළිවෙත් අතුරින් නිවැරදි පිළිවෙත් පමණක් සඳහන් වරණය තෝරන්න.

*A* - පණ්ණශාලා නමින් හැඳින්වූ කොළ අතු සෙවිළි කළ ආරාමයක භික්ෂූන් වහන්සේලා ලැගුම් ගැනීම සුදුසු ය.

*B* - ග්‍රීෂ්ම සමයේ චාරිකා නොකර වස් එළඹීම සුදුසු ය.

*C* - පාරිසරික සම්පත් භාවිතයෙන් නිමවාගත් පාත්‍රය භික්ෂූන් වහන්සේලාගේ දෛනික පරිහරණ කටයුතු සඳහා සුදුසු ය.


(1) *A* සහ *B* පමණි. (2) *A* සහ *C* පමණි.
(3) *B* සහ *C* පමණි. (4) *A*, *B*, *C* සියල්ලම. (.........)



Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

● අංක **36** සිට **38** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත ප්‍රස්තාරය උපයෝගී කරගන්න.

**ලෝකයේ මහාද්වීප අනුව නාගරික ජනසංඛ්‍යා වර්ධනය**
**(මහද්වීපවල මුළු ජනසංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන්)**




36. 1950 සහ 2020 යන වර්ෂ දෙකෙහිදීම ඉහළම නාගරික ජනසංඛ්‍යාවක් දැකිය හැකි මහාද්වීපය කුමක් ද?
    (1) ආසියාව (2) දකුණු ඇමරිකාව (3) උතුරු ඇමරිකාව (4) යුරෝපය (.........)

37. 1950 වර්ෂයේ සිට 2020 වන විට නාගරික ජන සංඛ්‍යාව වැඩිම ප්‍රතිශතයකින් වර්ධනය වී ඇති මහාද්වීපය කුමක් ද?
    (1) අප්‍රිකාව (2) දකුණු ඇමරිකාව (3) ආසියාව (4) යුරෝපය (.........)

38. ප්‍රස්තාරයේ තොරතුරුවලට අනුව වැරදි ප්‍රකාශය තෝරන්න.
    (1) අප්‍රිකාවේ නාගරික ජනසංඛ්‍යාව අනෙක් මහාද්වීපවලට සාපේක්ෂව අඩු මට්ටමක පවතී.
    (2) වර්ෂ 1950 ට සාපේක්ෂව 2020 දී සෑම මහාද්වීපයකම නාගරික ජන සංඛ්‍යාව වර්ධනය වී ඇත.
    (3) 2020 දී ලෝක ජනසංඛ්‍යාවෙන් අඩකට වඩා වැඩි ප්‍රතිශතයක් නාගරික කලාපවල ජීවත් වේ.
    (4) 1950 වර්ෂයේ දී සෑම මහාද්වීපයකම නාගරික ජනසංඛ්‍යාව 50%ට අඩු මට්ටමක පවතී. (.........)

● අංක **39** සහ **40** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සාධක යුගල පහ උපයෝගී කර ගන්න.

*A.* (i) ගොවිතැන සඳහා යන්ත්‍ර සූත්‍ර භාවිතය
    (ii) මිනිස් ශ්‍රමයේ අවශ්‍යතාව

*B.* (i) නාගරික ජනගහනය
    (ii) පරිසර දූෂණය

*C.* (i) ජන සංඛ්‍යාව
    (ii) ජන ඝනත්වය

*D.* (i) ජන සංක්‍රමණ
    (ii) උපත් අනුපාතිකය

*E.* (i) අධිවේගී මාර්ග ඉදිකිරීම
    (ii) ගමනාන්තයට යාමට ගතවන කාලය

39. පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නේ ද වැඩිවීමට හේතු වන සාධක යුගල දෙක දැක්වෙන වරණය කුමක් ද?
    (1) *A* සහ *B* (2) *B* සහ *C* (3) *C* සහ *D* (4) *D* සහ *E* (.........)

40. පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නේ අඩුවීමට හේතු වන සාධක යුගල දෙක දැක්වෙන වරණය කුමක් ද?
    (1) *A* සහ *B* (2) *A* සහ *E* (3) *B* සහ *C* (4) *B* සහ *D* (.........)

* *



Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

10 S I, II

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2568 - පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2024 (2025)

## (10) භූගෝල විද්‍යාව - I, II

### භූගෝල විද්‍යාව - II පත්‍රය

- ✳ මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් සමන්විත ය.
- ✳ I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද II කොටසින් ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.
- ✳ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.
- ✳ ඇමුණුම් 2 සහ 3 ඔබේ පිළිතුරු පත්‍රයට අමුණන්න.

### I කොටස

1. (අ) ඔබ වෙත සපයා ඇති 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස (ඇමුණුම 01) අධ්‍යයනය කොට, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලබාදීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (ඇමුණුම 02) යොදා ගන්න.

අංක (i) සිට (vi) දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරන්න.

(i) Ⓐ – Ⓑ රේඛාවෙන් දැක්වෙන භූ රූපය කුමක් ද?
(නිම්නය / තෙරුව / බෑවුම) *(ලකුණු 01 යි)*

(ii) Ⓒ ස්ථානයේ ත්‍රිකෝණමිතික ලක්ෂණය මගින් දැක්වෙන කඳු මුදුනේ උස මීන් කුමක් ද?
(248 m / 286 m / 302 m) *(ලකුණු 01 යි)*

(iii) Ⓓ ස්ථානයේ ඇති සංඛ්‍යාවෙන් කුමක් අදහස් වේ ද?
(ස්ථානීය උස / මහාමාර්ගයේ දුර / සමෝච්ච රේඛා අගය) *(ලකුණු 01 යි)*

(iv) Ⓔ අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමක් ද?
(තානායම / ඓතිහාසික ස්ථානය / හෝටලය) *(ලකුණු 01 යි)*

(v) Ⓕ අක්ෂරයෙන් දැක්වෙන ලක්ෂණය කුමක් ද?
(අඩි පාර / වාරි ඇල / කරත්ත පාර) *(ලකුණු 01 යි)*

(vi) ප්‍රදේශයේ දකුණු මායිමට ආසන්නව පිහිටි වැව් බැම්මේ දිග ආසන්න වශයෙන් කොපමණ වේ ද?
(2 km / 4 km / 6 km) *(ලකුණු 01 යි)*

(vii) Ⓟ අක්ෂරයෙන් දැක්වෙන චතුරස්‍රය තුළ සංකේත මගින් දක්වා ඇති මහජන සේවා සපයන ආයතන දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

- සිතියම්ගත ප්‍රදේශය කඩ ඉරි මගින් කලාප හතරකට වෙන් කර, ඒවා W, X, Y, Z ලෙස නම් කර ඇත. ඒවා හොඳින් අධ්‍යයනය කර (viii) ප්‍රශ්නයේ (a) සහ (b) කොටස් දෙකට පිළිතුරු සපයන්න.

(viii) (A) මීටර 40 - 80 අතර පිහිටි උසකින් ද අතු ගංගා කිහිපයකින් ද සමන්විත ශාඛීය ජලවහන රටාවක් ඇති කලාපය දැක්වෙන අක්ෂරය කුමක් ද? *(ලකුණු 01 යි)*

(B) විසුරුණු ජනාවාසවලින් යුත් සංවර්ධිත කෘෂිකාර්මික කලාපය දැක්වෙන අක්ෂරය කුමක් ද? *(ලකුණු 01 යි)*

(ආ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියම (ඇමුණුම 03) අධ්‍යයනය කොට, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරින් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, ඇමුණුම 03 හි අදාළ ස්ථානයේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ලියා දක්වන්න.

(i) වික්ටෝරියා ජලාශය (Ⓐ, Ⓑ, Ⓒ)
(ii) ආරුගම්බේ (Ⓓ, Ⓔ, Ⓕ)
(iii) කලා ඔය (Ⓙ, Ⓚ, Ⓛ)
(iv) කොළඹ වරාය නගරය (Ⓟ, Ⓠ, Ⓡ)
(v) මුලතිව් දිස්ත්‍රික්කය (Ⓧ, Ⓨ, Ⓩ)

*(ලකුණු 05 යි)*

[ 6 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

(ඉ) ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියම අධ්‍යයනය කොට, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (ඇමුණුම **03** බලන්න).

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරින් නිවැරදි පිළිතුර හිමි අක්ෂරය සිතියමෙන් තෝරා, ඇමුණුම **03**හි අදාළ ස්ථානයේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ලියා දක්වන්න.

(i) පැරිස් නගරය (Ⓐ, Ⓑ, Ⓒ)

(ii) ජපන් දූපත් (Ⓓ, Ⓔ, Ⓕ)

(iii) රොකී කඳුවැටිය (Ⓙ, Ⓚ, Ⓛ)

(iv) නයිල් ගඟ (Ⓟ, Ⓠ, Ⓡ)

(v) නැගෙනහිර 80° දේශාංශය (Ⓧ, Ⓨ, Ⓩ)

*(ලකුණු 05 යි)*

## II කොටස

**2.** පහත (a) හා (b) ලෙස ප්‍රකාශයට පත්කර ඇත්තේ එක්තරා දිනක පැවති කාලගුණික තොරතුරු ය.

(a) 28.5 °C (b) 150 mm

(i) (a) හා (b) හි දැක්වෙන කාලගුණික මූලිකාංග අනුපිළිවෙළින් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ශ්‍රී ලංකාවේ දේශගුණයේ ඇති ප්‍රාදේශීය විවිධත්වයට බලපාන ස්ථානීය සාධක තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ක්‍රම තුනක් සඳහන් කර, ඉන් එකක් මගින් වර්ෂාව ලැබෙන කාලය හා අධික වැසි ලැබෙන ප්‍රදේශ පිළිබඳ පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**3.** (i) ස්වභාවික වෘක්ෂලතා යනු මොනවාදැයි කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 02 යි)*

(ii) පහත Ⓐ, Ⓑ හා Ⓒ වනාන්තර අයත් වන්නේ ශ්‍රී ලංකාවේ කුමන ස්වභාවික වෘක්ෂලතා කලාපවලට දැයි අනුපිළිවෙළින් දක්වන්න. *(ලකුණු 03 යි)*

| Ⓐ | Ⓑ | Ⓒ |
|---|---|---|
| සිංහරාජ | මාදුරු ඔය | හෝර්ටන්තැන්න |
| කන්නෙලිය | උඩවලව | සීතා එළිය |
| දෙදියගල | වස්ගමුව | සඳතැන්න |

(iii) "ශ්‍රී ලංකාවේ ජලසම්පත ක්‍රමයෙන් දූෂණයට ලක්වෙමින් පවතී."
යන ප්‍රකාශය සැලකිල්ලට ගනිමින්

(අ) ජල දූෂණයට බලපාන මානව ක්‍රියාකාරකම් තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*


(ආ) ජල සම්පත සංරක්ෂණය සඳහා ඔබට යෝජනා කළ හැකි ක්‍රියාමාර්ගයක් පැහැදිලි කරන්න. *(ලකුණු 02 යි)*

[ 7 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**4.** (i) ලෝක ව්‍යාපාරික කෘෂිකර්මාන්තයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) යාබද සිතියමෙහි Ⓐ, Ⓑ හා Ⓒ වශයෙන් දිස්ත්‍රික්ක තුනක් දක්වා ඇත. කරදමුංගු, මල්වර්ග හා කජු යන සුළු අපනයන බෝග අතුරින් එම දිස්ත්‍රික්කවල ප්‍රමුඛස්ථානය ගන්නා බෝග වර්ගය Ⓐ, Ⓑ හා Ⓒ අනුපිළිවෙළින් දක්වන්න. *(ලකුණු 03 යි)*




(iii) (අ) ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය තුළ සුළු අපනයන බෝග වගාව වැදගත් වීමට හේතු තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(ආ) ඔබ දැක්වූ හේතුවලින් **එකක්** ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා බලපාන ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 02 යි)*

**5.** (i) ලෝකයේ කර්මාන්ත සඳහා බලශක්තිය ලෙස යොදාගන්නා පොසිල ඉන්ධන **දෙකක්** නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ලෝකයේ යකඩ හා වානේ කර්මාන්තය ව්‍යාප්තව ඇති ප්‍රදේශ කිහිපයක් පහත සඳහන් වේ. එම ප්‍රදේශ අයත්වන රටවල් මොනවාදැයි අනුපිළිවෙළින් ලියන්න.

(අ) ඔසාකා, කෝබේ

(ආ) බර්මිංහැම්, ලැන්කැෂයර්

(ඉ) පිට්ස්බර්ග්, ඩිට්‍රොයිට් *(ලකුණු 03 යි)*

(iii) (අ) මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තයේ නව ප්‍රවණතා **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(ආ) ශ්‍රී ලංකාව තුළ ප්‍රවාහන කටයුතු ක්‍රමයෙන් වර්ධනය වීම නිසා ඇතිවන පරිසර දූෂණය අවම කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ගයක් පැහැදිලි කරන්න. *(ලකුණු 02 යි)*

**6.** (i) ජනසංඛ්‍යාවේ විශාලත්වය අනුව ලෝකයේ ප්‍රමුඛස්ථානය ගන්නා රටවල් තුන අතුරින්,

(අ) ආසියාතික රටක් ද

(ආ) ආසියාවෙන් බැහැර රටක් ද

නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ලෝකයේ ජන හීන කලාප තුනක් පහත දැක්වේ.

(අ) හිමාලය, ඇන්ඩීස්

(ආ) කොන්ගෝ, ඇමේසන්

(ඉ) උතුරු අප්‍රිකාව, මධ්‍යම ඔස්ට්‍රේලියාව

ඒ එක් එක් කලාපය ජනහීන වීමට බලපා ඇති භෞතික සාධකය අනුපිළිවෙළින් ලියා දක්වන්න. *(ලකුණු 03 යි)*

(iii) පසුගිය වසර ගණනක කාලය තුළ ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ජන සංක්‍රමණයට බලපෑ හේතු **තුනක්** දක්වා, ඉන් **එකක්** පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

[ 8 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**7.** (i) ශ්‍රී ලංකාවේ කර්මාන්ත අතුරින්

(අ) කෘෂි පාදක කර්මාන්තයක් ද

(ආ) ඛනිජ පාදක කර්මාන්තයක් ද

සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් කැණීමෙන් ඇති වී තිබෙන පාරිසරික ගැටලු **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) රූපවාහිනිය, අන්තර්ජාලය වැනි ශ්‍රව්‍යදෘශ්‍ය මාධ්‍යයන් ඔබගේ අධ්‍යාපන කටයුතු සඳහා උපකාරී වන ආකාරය උදාහරණ **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**8.** (i) ශ්‍රී ලංකාවේ නායයෑම් ආපදාව ප්‍රබල වීමට බලපාන භෞතික හේතු **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) කිසියම් ප්‍රදේශයක ආපදාවක් ඇති වූ විට ඊට ප්‍රතිචාර දැක්වීම සඳහා ගත හැකි පියවර **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) (අ) මෑත භාගයේදී ශ්‍රී ලංකාවේ ඇති වූ ජල ගැලීම් නිසා කෘෂිකර්මාන්තයට, ප්‍රවාහනයට හා නිවාසවලට සිදු වූ හානි පැහැදිලි කෙරෙන කරුණු **එක** බැගින් දක්වන්න. *(ලකුණු 03 යි)*

(ආ) ඉහත (අ) හි දැක්වූ හානිවලින් එකක් අවම කර ගත හැකි ක්‍රියාමාර්ගයක් පැහැදිලි කරන්න. *(ලකුණු 02 යි)*

* * *

Department of Examinations Sri Lanka

(ඇමුණුම 01/Annexure 01)


සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கை பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2568 - පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2024(2025)
# 2568 - Piriven Ordinary Level Examination - 2024(2025)

## (10) භූගෝල විද්‍යාව - II පත්‍රය / Geography- Paper II

**1.** (අ) භූ ලක්ෂණ සිතියම් කොටස / (a) Topographic Map Section




SCALE 1 : 50,000

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2568 - පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2024(2025)

## (10) භූගෝල විද්‍යාව - II පත්‍රය

II පත්‍රයේ I කොටසේ (අ), (ආ) සහ (ඉ) ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා මෙම කඩදාසිය යොදා ගන්න. මෙය ඔබේ පිළිතුරු පත්‍රයට අමුණන්න.

විභාග අංකය : ..........................................

..........................................
නිරීක්ෂකගේ අත්සන

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.

1. (අ) (i) ..........................................

(ii) ..........................................

(iii) ..........................................

(iv) ..........................................

(v) ..........................................

(vi) ..........................................

(vii) ..........................................

..........................................


(viii) (A) ..........................................

(B) ..........................................

මුළු ලකුණු

Department of Examinations Sri Lanka

**1.** (ආ)




(i)

(ii)


(iii)

(iv)

(v)

5

**1.** (ඉ)




(i)

(ii)

(iii)

(iv)

(v)

5

**1.** (අ) 10 + (ආ) 5 + (ඉ) 5 = 20

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka